# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2011/9 - 2017 මාර්තු මස 21 වැනි අඟහරුවාදා - 2017.03.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියෝග

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය, මලික් සමරවික්‍රම වන මම, මුදල් අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 (1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2016.11.11 දිනැති අංක 1992/52 දරන *අති විශේෂ ගැසට් නිවේදනයේ* 2 වන ඡේදය, එහි (ix) වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන නව අයිතම එකතු කිරීම මගින් සංශෝධනය කරමි.

(x) පිළිගත් ටයර් නිෂ්පාදකයෙකු විසින් දේශීයව අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා ආනයනය කරනු ලබන සලකුණු නොමැති ටයර් ආවරණ, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

(xi) දේශීය දුනුකොළ නිෂ්පාදකයෙකු විසින් ආනයනය කරනු ලබන තාපයෙන් මැඩීම, තාපයෙන් ඇදීම හෝ නෙරපීම හැර තවදුරටත් නොසැකසූ වානේ දඬු සහ පොලු වර්ග, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

(xii) සත්ව පාලනයේ යෙදෙන දේශීය ගොවීන්හට සයිලේජ් සැපයීම සඳහා සයිලේජ් නිෂ්පාදකයෙකු විසින් ආනයනය කරනු ලබන රේඛීය අඩු ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ නිර්දේශය මත, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව,

මෙම නියෝගය 2017 මාර්තු මස 22 වැනි දින, සිට බලපැවැත්වේ.

මලික් සමරවික්‍රම,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය.

2017 මාර්තු මස 17 වැනි දින,
කොළඹ 01,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ දී ය.

04 - 50


1A - PG 3458 — 557 (2017/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*